ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No.
2323730

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail
cabsecsl@sltnet.lk

වෙබ් අඩවිය
வெப் தளம்
Web Site
www.CabinetOffice.gov.l

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

ජනරජ චතුරස්‍රය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
குடியரசுச் சதுக்கம், சேர் பாரோன் ஜயதிலக்க மாவத்தை, கொழும்பு 01.
Republic Square, Sir Baron Jayathilaka Mawatha, Colombo 01.

මගේ අංකය
எனது இல.
My No.
CB/PA/MISC II

ඔබේ අංකය
உமது இல.
Your No.

2010.12.03

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.

**අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා**
**අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අමාත්‍ය මණ්ඩල සංදේශ හා**
**<u>අමාත්‍ය මණ්ඩල සටහන් ඉදිරිපත් කිරීම</u>**

2010 නොවැම්බර් 22 වන දින ස්ථාපනයකරන ලද අමාත්‍ය මණ්ඩලය වෙත ගරු අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් අමාත්‍ය මණ්ඩල කාර්යාලයට එවීමේදී පහත දැක්වෙන පරිදි කටයුතු කරන ලෙසට කාරුණිකව දන්වා සිටිමි.

**(අ) ආවරණ ලිපිය:**

අමාත්‍ය මණ්ඩල සංදේශයට හෝ සටහනට අදාළ ආවරණ ලිපිය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව අතිරේක ලේකම්වරයෙකු/ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු විසින් අත්සන් කළයුතු වන අතර, එය අදාළ සංදේශයේ/සටහනේ මුල්පතට අමුණා එවිය යුතුය.

**(ආ) අමාත්‍ය මණ්ඩල සංදේශ කට්ටලයක් පිළියෙල කිරීම:**

අමාත්‍ය මණ්ඩල සංදේශ කට්ටලයක් පිළියෙල කිරීමේදී එහි සංදේශය භාෂාත්‍රයෙන් සකස් කර තනි පිටුවල පමණක් මුද්‍රණය කළයුතුවන අතර, එම කට්ටලයක් සැකසීමේදී සිංහල භාෂා පිටපත පළමුව ද දෙමළ භාෂා පිටපත දෙවනුව ද ඉංග්‍රීසි භාෂා පිටපත තෙවනුව ද සිටිනසේ පිළියෙල කළ යුතුවන අතර, ඇමුණුම් තිබෙනම් ඒවා සංදේශයේ උක්ත පිටපත් තුනට යටින් ඉහත දැක්වෙන භාෂා අනු පිළිවෙලින් අමුණා එවිය යුතුය. කඩදාසි අරපිරිමැසීම සඳහා එම ඇමුණුම් පිටපත් කඩදාසි දෙපැත්තෙහිම මුද්‍රණය කළ හැකි වේ.

**(ඇ) පිටපත් සංඛ්‍යාව:**

ලිපි ද්‍රව්‍ය වියදම් අවම කිරීම සඳහා නැවත දැනුම්දෙනතුරු, අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත එවීමේදී පහත දැක්වෙන පරිදි පිටපත් සියයකින් (100) එවීමට ක්‍රියා කළයුතුය.

(i) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් අමුණන ලද කට්ටල සංඛ්‍යාව - 15

(ii) සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන් පමණක් පිළියෙල කර අමුණන ලද කට්ටල සංඛ්‍යාව - 85

(ඇ) **ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන රජයේ නිලධාරීන්ගේ විනය කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ:**

(I) මුල් පිටපත ඇතුළුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් පිළියෙල කර අමුණන ලද සංදේශ කට්ටල පහලොවක් (15) පහත දැක්වෙන ඇමුණුම් පිටපත් සහිතව (එක් එක් කට්ටලයට යාකොට) එවිය යුතුය:

- ✶ මූලික විමර්ශණ වාර්තාව
- ✶ චෝදනා පත්‍රය
- ✶ චූදිත නිලධාරියාගේ පිළිතුර
- ✶ විධිමත් විනය පරීක්ෂණ වාර්තාව
- ✶ අදාළ ආයතන ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ඇතුළත් වාර්තාව (බී වාර්තාව)
- ✶ නිලධාරියාගේ චර්යාපත.
- ✶ වෙනත් අදාළ ලියවිලි.

(II) සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් පිළියෙල කරනු ලබන සංදේශ කට්ටල විසිපහක් (25) පහත දැක්වෙන ඇමුණුම් පිටපත් සහිතව (එක් එක් කට්ටලයට යාකොට) එවිය යුතුය:

- ✶ මූලික පරීක්ෂණ වාර්තාව.
- ✶ චෝදනා පත්‍රය.
- ✶ චූදිත නිලධාරියාගේ පිළිතුර.
- ✶ විධිමත් විනය පරීක්ෂණ වාර්තාව.
- ✶ අදාළ ආයතන ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය ඇතුළත් වාර්තාව (බී වාර්තාව).
- ✶ නිලධාරියාගේ චර්යාපත.
- ✶ වෙනත් අදාළ ලියවිලි.

(III) සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් පිළියෙලකර ඉදිරිපත් කරනු ලබන ඉතිරි සංදේශ කට්ටල හැට (60) පහත දැක්වෙන ඇමුණුම් පිටපත් සහිතව (එක් එක් කට්ටලයට යාකොට) එවිය යුතුය:

- ✶ මූලික පරීක්ෂණ වාර්තාව.
- ✶ චෝදනා පත්‍රය.
- ✶ චූදිත නිලධාරියාගේ පිළිතුර.
- ✶ අදාළ ආයතන ප්‍රධානියාගේ සහ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය ඇතුළත් වාර්තාව (බී වාර්තාව).
- ✶ නිලධාරියාගේ චර්යාපත.
- ✶ වෙනත් අදාළ ලියවිලි.

එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.